**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව දිනය - 2022.09.27 වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා 2.ගරු උප සභාපති - ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.මී.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9. කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා
10.එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11.ඒ.ජී.තිලකරත්න මැතිතුමා
12.ඩී.ඒ.සුනිල් දෙයියාගල මැතිතුමා
13.පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා
14.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
15.එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා
16.ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
17.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
18.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
19.එස්.සුදර්ශන් මැතිතුමා
20.ටී.පී.ජී.කීර්තිසේන අල්විස් මැතිතුමා
21.එච්.ඒ.දිල්සාන් මධුෂිකා මැතිනිය
22.කේ.මධුෂිකා ප්‍රශාදිනි ජයසිංහ මැතිනිය
23.එම්.ඩී.ඥානවති මැතිනිය
24.ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
25.බී .සීතා රංජනි මැතිනිය
26.ඒ.පී.ඩබ්ලිව්.ජ්ම්.පී.ඩයනා උදයංගනි මැතිනිය
27.කේ. කමල්රාජ් මැතිනිය

**සහභාගි වූ නිලධාරීන්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා 2.සංවර්ධන නිලධාරි - ආර්.එච්.සී.නිසාන්ති සෙනවිරත්න මිය

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහි කිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් පාලන ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රීතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වී සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.වසර පහකට ආසන්න කාලයක් ජනතාව වෙනුවෙන් යම් මෙහෙවරක් ඉෂ්ඨ කළා. රෝහල් ගතවෙලා සිටින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත මැතිතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරනවා.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.08.23 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරීම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරීම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒම්.කේ.කේ සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2022.07.19 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරිම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.08.23 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

***.** 2015 මැයි මස සභික දීමනා වශයෙන් ගෙවීම් කර ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කරන ලද රු.240,000.00 ක මුදලින් අඩක් වන රු.120,000.00 ක මුදලක් පමණක් ප්‍රතිපූර්ණය කිරීම නිසා ප්‍රතිපූර්ණය නොවූ රු.120,000.00 මුදලින් මෙතෙක් අය කර ගැනිමට අපොහොසත් වී ඇති රු.37500.00 ක මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. ප්‍රතිපූර්ණය නොවූ 120,000.00 ක මුදල එම ධූරධාරින් ගෙවීම් කිරිම සඳහා නීතිමය ප්‍රතිපාදන නොමැති කාලසීමාවක් සඳහා ගෙවීම් කර ඇති මුදලක් බැවින් කපා හැරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීමේ හැකියාවක් නොමැති බවත් මෙම ගෙවීම් කර ඇත්තේ ගරු සේවාවක් සඳහා පැමිණි

පිරිසක් වෙත බැවින් ඔවුන් වෙත එම තත්වයද පෙන්වා දී අදාල මුදල් ආපසු අය කර ගැනිමට කටයුතු කරන ලෙසත් එසේ අයකර ගැනීමට නොහැකි වන අවස්ථාවක අදාළ ගෙවීම් කිරිමට සම්බන්ධ වූ නිලධාරින් වෙත එම මුදල අධිභාර වීමේ අවධානමක් ඇති බවත් පළාත් පාලන කොමසාරිස්ගේ ACK/2/4 හා 2022.08.17 දිනැති ලිපියෙන් පෙන්වා දී ඇති බව නිවේදනය කරමි.

*. සබරගමු පළාත් ප්‍රධාන ගරු ලේකම් විසින් 2022.09.08 දින දැනුම් දී ඇති රාජ්‍ය ආයතනවල රාජ්‍යය වියදම් පාලනය කිරිම 2022.06.24 අංක 10/2022 හා 11/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛනය අනුව කටයුතු කරන ලෙස දන්වා ඇත.

*. 2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය ලබා දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය පාලනය කිරිම සම්බන්ධයෙන් ජාතික අයවැය චක්‍රලේක 03/2022 හි සඳහන් උපදෙස් දැඩිව පිළිපදින ලෙසත් දන්වා ඇත.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**
**(ඉ) කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 01. 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමේ කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 3:4:3 වගන්තිය ප්‍රකාරව සිදු කළ යුතුව ඇත. පසුගිය වසරෙහි එක් එක් භාණ්ඩ සැපයුම් සේවාවන් හා කොන්ත්‍රාත් සඳහා ලියා පදිංචි වීමට අයකළ මුදල පහත පරිදි වේ.

1. භාණ්ඩ සැපයීම හා සේවාවන් සඳහා රු.1,000.00
2. කොන්ත්‍රාත් සඳහා
   - රු.100,000.00 දක්වා — රු.1,500.00
   - රු.100,000.00 - රු.200,000.00 — රු.2,175.00
   - රු.200,000.00 - රු.300,000.00 — රු.3,600.00
   - රු.300,000.00 - රු.400,000.00 — රු.4,275.00
   - රු.400,000.00 - රු.500,000.00 — රු.5,700.045
   - රු.500,000.00ට වැඩි වටිනාකම සඳහා — රු.6,300.00

ඒ අනුව 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමේදී ඉහත ගාස්තු ප්‍රමාණයම අයකරන්නේද නැතහොත් ගාස්තු සංශෝධනයක් සිදු කරන්නේද යන්න පිළිබඳව තිරණය කිරීමටත් පුවත්පත් දැන්වීම් පළකිරීමේදී සිංහල,දෙමළ,ඉංග්‍රීසි භාෂා තුනෙන්ම පළ කිරිමටත් ඒ සඳහා වන වියදම සභා අරමුදලින් දැරීමටත් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා ඔබගේ යෝජනාව සභාවට ඉදිරිපත් කරන්න

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා** (ඉ) 02. යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මහභාගේ ග්‍රාම නිලධාරි වසමේ කොටසක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වන පරිදි සීමා නිර්ණය කිරිම තුළ මහභාගේ ජනතාවගේ පුද්ගල අයිතිවාසිකම්වලට බලපෑම් සිදු වීම සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඒම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව සඳහා සාකච්ඡා කර තීරණයක් ගැනීමට මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා** ගරු සභාපතිතුමනි,මහභාගේ කොටසක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා තමයි ජනතාවගේ විදුලි බිල්,ජල බිල් බැංකු කටයුතු ආදි සියළුම කාරණා සිද්ධ වෙන්නේ, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ,කිලෝමීටරයක් පමණ දුරක් තමයි තියෙන්නේ නමුත් කිතුල්ගලට පැමිණෙන්න කිලෝමීටර් 10පමණ තියෙනවා.සමහර මාර්ග කොන්ක්‍රිට් කිරිම අළුත්වැඩියා කිරිම් අඹගමුව ප්‍රාදේශීය කොට්ඨාශය හරහා සිදු වෙනවා .මෙම කොටස නුවරඑළිය දිස්ත්‍රික්කයට අයිති විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.නිමල් විජේසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, අක්කර 80 ක් පමණ නුවරඑළිය දිස්ත්‍රික්කයට අයිතිවන විදිහට තමයි සීමා නිර්ණ නිර්දේශ වාර්තාවේ සඳහන් වන්නේ,මෙහි පරිපාලන කටයුතු සිදු කිරිමේ ගැටළුවක් පවතිනවා. මෙම කොටස කෑගල්ල දිසිත්‍රික්කයට අයිතිවිය යුතුයි .නැතහොත් ලංකා සිතියම වෙනස් කළ යුතුයි.

**ගරු උප සභාපති ඒ.වී රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බල්ලහැල සහ බැහැනැල්ල යන ග්‍රාම නිලධාරි වසම් යටියන්තොට බල ප්‍රදේශයට ඉතාමත් කිට්ටුයි.දැරණියගලට යාමට අපහසුයි. එම නිසා මෙම බල්ලහැල සහ බැහැනැල්ල යන ග්‍රාම නිලධාරි යටියන්තොට බල ප්‍රදේශයට ගැනීමට මා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව මහභාගේ ගමෙන් කොටසක් නුවර එළිය දිස්ත්‍රික්කයට පැවරීම හා බල්ලහැල හා බැහැනැල්ල ග්‍රාම නිලධාරි වසම් යටියන්තොට සභාවට එකතුකිරීම සුදුසු බැව් දැනට ලැබී තිබෙන නිර්දේශ වලින් ලේඛනයේ නම් කළ ස්ථානවලට එකඟ නොවන බවත් ඒ සඳහා නැවත සළකා බලන ලෙසත් , දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා යැවීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඉහත නිවේදනය කළ පරිදි ස්ථිර වීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 03. 2021.05.11 දිනැති තීරණ අංක 13 මත ආදේශක සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස 2022.08.01 දින සිට 2023.08.02 දක්වා සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගන්නා ජාතික හැඳුනුම්පත් අංක 200227004759 යටියන්තොට පරුස්සැල්ල පාර ටී.සී නිවාස ලිපිනයේ පදිංචි ශිවලිංගම් අජිත් මහතාගේ සේවා ගිවිසුම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 04. 2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2011 වර්ෂයේ වාර්ෂික තක්සේරු වටිනාකම් 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ

(අ) අංක 106 යටියන්තොට ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ, වරිපනම් අංක 01 සිට වරිපනම් අංක 251 දක්වා හා එහි අනු අංක සහිතව මාර්ගයේ වමද, වරිපනම් අංක 02 සිට වරිපනම් අංක 282 දක්වා හා එහි අනු අංකද සහිතව මාර්ගයේ දකුණින් ද පිහිටි දියුණු කළ ප්‍රදේශයේ සෑම නිශ්වල දේපළකම වාර්ෂික වටිනාකමෙන් සියයට දාහතරක (14%)ක වරිපනමක්ද,

(ආ) අංක 134 කිතුල්ගල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ පිහිටි දියුණු කළ ප්‍රදේශයේ සෑම නිශ්වල දේපළක වාර්ෂික වටිනාකමෙන් සියයට දහයක (10%)ක වරිපනමක්ද,

(ඇ) අංක 106 යටියන්තොට ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ වරිපනම් අංක 253 සිට 303 දක්වා හා එහි අනු අංකද සහිතව මාර්ගයේ වමද , වරිපනම් අංක 284 සිට 336/1 දක්වා හා එහි අනු අංක ද සහිතව මාර්ගයේ දකුණින්ද, අංක 106 ඒ පරුස්සැල්ල, අංක 15 සී පහළ ගරාගොඩ, 115 ඩී ඉහළ ගරාගොඩ හා 106 බී කබුලුමුල්ල යන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ පිහිටි දියුණු කළ ප්‍රදේශයේ සෑම නිශ්වල දේපළක වාර්ෂික වටිනාකමෙන් සියයට නවයක (9%)ක වරිපනමක්ද,

2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් ,

නියමිත කාර්තු තුළදී අදාල බදු මුදල නොගෙවීම මත 10% ක අධි ගාස්තුවක් අය කිරීමටත් යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

| .කාර්තුව | ගෙවිය යුතු කාලය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු කාර්තුව | 2023 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා | 2023 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2023 අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා | 2023 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2023 ජුලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා | 2023 ජුලි 31 |
| හතරවන කාර්තුව | 2023 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා | 2023 ඔක්තොබර් 31 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.නමුත් මෙහි වට්ටම් පිළිබඳව සඳහන් කළ යුතුයි.බදු මුදල් නොගෙවීම මත 15% ක ගාස්තුවක් අය කිරීම සුදුසුයි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව ජනවාරි 31ට පෙර අදාළ වර්ෂයේ මුදල සම්පූර්ණ ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ වරිපනම් මුදලින් සියයට (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවීමටත්,නියමිත කාර්තු තුළදි මුදල නොගෙවීම මත 15% ක අධි ගාස්තුවක් අය කිරීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් ජනවාරි 31ට පෙර අදාළ වර්ෂයේ මුදල සම්පූර්ණ ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ වරිපනම් මුදලින් සියයට (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවීමටත්,නියමිත කාර්තු තුළදි මුදල නොගෙවීම මත 15% ක අධි ගාස්තුවක් අය කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**( සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 05.2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**<u>යෝජනාව</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තා වූද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ,එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක්,

(අ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3)වැනි උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යාතුමා විසින් යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1989.03.10 දිනැති ගැසට් පත්‍රයේ iv (ආ) වැනි කොටසේ ප්‍රකාශයට පත් කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු වූ සෑම ඉඩමක් මත 2023 වර්ෂය සඳහා එක් එක් හෙක්ටාරයක් මත රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමට සහ ,

(ආ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන්ම එකී ඉඩමේ වැඩිවන සෑම හෙක්ටයාරයක්ම මත 2023 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමටත්,

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31,ජුනි 30,සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමටත්,

නියමිත කාර්තු තුළදී අදාල බදු මුදල නොගෙවීම මත 10% ක අධි ගාස්තුවක් අය කිරීමටත් යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

| කාර්තුව | ගෙවිය යුතු කාලය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| පළමු කාර්තුව | 2023 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා | 2023 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2023 අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා | 2023 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2023 ජුලි 01 සිට සැප්තැම්බර් 30 දක්වා | 2023 ජුලි 31 |
| හතරවන කාර්තුව | 2023 ඔක්තෝබර් 01 සිට දෙසැම්බර් 31 දක්වා | 2023 ඔක්තොබර් 31 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.වට්ටම් පිළිබඳ සඳහන් කරන්න.බදු නොගෙවීම මත 15% ගාස්තුවක් අය කර ගනිමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව අනුව ජනවාරි 31ට පෙර අදාළ වර්ෂයේ මුදල සම්පූර්ණ ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ වරිපනම් මුදලින් සියයට (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවීමටත්,නියමිත කාර්තු තුළදි මුදල නොගෙවීම මත 15% ක අධි ගාස්තුවක් අය කිරීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් ජනවාරි 31ට පෙර අදාළ වර්ෂයේ මුදල සම්පූර්ණ ගෙවනු ලැබුව හොත් එම සම්පූර්ණ වරිපනම් මුදලින් සියයට (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවීමටත්,නියමිත කාර්තු තුළදි මුදල නොගෙවීම මත 15% ක අධි ගාස්තුවක් අය කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 06. 2023 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**යෝජනාව**

2019.12.05 දිනැති අංක 2152/58 දරන පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ සබරගමු පළාත් ආණ්ඩුකාරතුමන් විසින් ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල , අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත 58, අන්තරායදායක ව්‍යාපාර හෝ කර්මාන්ත 31 සහ අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත 38 ,වෙනත් ව්‍යාපාර හෝ කර්මාන්ත 15ක් සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රාකාර පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ 11 වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

උපලේඛනය

| | 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | බලය දෙනු ලබන කාර්යය | පරිශ්‍රයේ හි වාර්ෂික වටිනාකම | | |
| | | රු.750 නොඉක්මවන අවස්ථාවක | රු.750 නොඉක්මවන එහෙත් රු.1500 නොඉක්මවන අවස්ථාවක | රු.1500. ඉක්මවන අවස්ථාවක |
| 1. | මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 2. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 3. | සම් පදම් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 4. | රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 5. | රබර් භාණ්ඩ නිෂ්පාදනය. | 500.00 | 750.00 | 1000.00 |
| 6. | ඔට්ටපාලු ගබඩාකර තබා ගැනීම හෝ විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 7. | පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 8. | සත්ත්ව ආහාර නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 9. | සබන් නිෂ්පාදනය කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 10. | අලුත් ලෝහ හෝ පරණ ලෝහ මිලට ගැනීම හෝ ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ලෝහ සුන්බුන් හා අබලි ද්‍රව්‍යය මිලට ගැනීම හෝ ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 12. | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ඔපදැමීම. | 500.00 | 750.00 | 1000.00 |
| 13. | වේවැල් භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 14. | පොල් ලෙලි පෙඟවීම.(පල් කිරීම) | 500.00 | 750.00 | 1000.00 |
| 15. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 16. | බුරුසු වර්ග නිපදවීම.(දත් බුරුසු හැර) | 500.00 | 750.00 | 1000.00 |
| 17. | යන්ත්‍රානුසාරයෙන් දැව ඉරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 18. | පින්තාරු තීන්ත ,වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 19. | කෙඳි සායම් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 20. | සම් භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 21. | රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ නැවත ඇසිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 22. | ගෑස් මැන්ටල් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 23. | පොටි නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 24. | ඉටි පන්දම් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 25. | කපුරු නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 26. | ලියන තීන්ත, අච්චු තීන්ත, හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 27. | රෙදි සෝදන නිල් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 28. | ලාකඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 29. | සුවඳ විලවුන් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 30. | පාසැල් රටහුණු නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 31. | ටයර් හෝ ටියුබ් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 32. | ටයර් නැවත පිරවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 33. | ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 34. | සිමෙන්ති ගබඩා කිරීම, ඇස්බැස්ටස් ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 35. | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 36. | වැලි කඩදාසි නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 37. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 38. | ගඩොල් පිළිස්සීම හා විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 39. | යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම. | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 40. | උළු නිපදවීම හා විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 41. | භාවිතයට ගත් ගෝනි , බැරල් හා භාජන පිරිසිදු කර විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 42. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 43. | කුරුඳු, කරද මුංගු වේලා සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 44. | ගම් වර්ග නිපදවීම හෝ විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 45. | විෂබීජනාශක වර්ග නිෂ්පාදනය හෝ විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 46. | බැටරි පිරවීමේ හෝ ගබඩා කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 47. | පරණ බෝතල් එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 48. | අවමංගල සේවාවක් පවත්වාගෙනයාම. | 500.00 | 750.00 | 1000.00 |
| 49. | ගෘහ භාණ්ඩ නිපදවීම හා ගබඩාකර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 50. | මැණික් කැපීම හා ඔප දැමීම. | 500.00 | 750.00 | 1000.00 |
| 51. | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 52. | යාන්ත්‍රික බලයෙන් රෙදි වියන කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 53. | පිටි හෝ කුළු බඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 54. | සත්ත්ව ආහාර ගබඩා කර තබා ගැනීම හා විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 55. | ධාන්‍ය වර්ග ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 56. | පොලිතින් හෝ ඒ ආශ්‍රිත නිෂ්පාන කිරීම හෝ විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 57. | සපත්තු නිෂ්පාදනය හා විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 58. | ඉටිපන්දම් නිෂ්පාදනය හා විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |

අන්තරායදායක ව්‍යාපාර හෝ කර්මාන්ත

| | | | | |
|---|---|---|---|---|
| 1. | යාන්ත්‍රික බලයෙන් දැව ඉරීම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | කොප්පරා නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 3. | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හෝ වෙනත් යම් තෙල් වර්ගයක් සිඳීම හෝ ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 4. | පුළුන් ගබඩා කර තබා ගැනීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකස් කර විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 5. | ගිණිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 6. | මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය. | 500.00 | 750.00 | 1000.00 |
| 7. | කොහු හෝ වෙනත් කෙදි වර්ග නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 8. | කොහු හෝ වෙනත් කෙදි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 9. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 10. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 12. | දර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | උලු හා ගඩොල් ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | ටයර් හා ටියුබ් විකිණීමට ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | දැව ආශ්‍රිත ලෑලි නිෂ්පාදනය සහ දැව කුඩු ආශ්‍රිත නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 16. | කාඩ් බෝඩ් හා කඩදාසි භාවිතයෙන් කරන නිෂ්පාදන ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | ගල් හා පතුරු ගල් ආශ්‍රයෙන් කරන කර්මාන්ත. | 500.00 | 750.00 | 1000.00 |
| 18. | මැටි හා මැටි ආශ්‍රිත කර්මාන්ත. | 500.00 | 750.00 | 1000.00 |
| 19. | නිමි ඇඳුම් නිෂ්පාදන ආයතන | 500.00 | 750.00 | 1000.00 |
| 20. | රසායන ආශ්‍රිත රෙදි නිෂ්පාදන කර්මාන්ත. | 500.00 | 750.00 | 1000.00 |
| 21. | රෙදි සේදීම් ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 22. | බීඩි නිෂ්පාදනය හා ගබඩා කර තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 23. | වාහන අලුත් වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙනයාම. | 500.00 | 750.00 | 1000.00 |
| 24. | වාහනවල බඳ කොටස අලුත් වැඩියා කර තින්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 25. | වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 26. | මුද්‍රණාලයක් පවත්වාගෙනයාම. | 500.00 | 750.00 | 1000.00 |
| 27. | පරණ පත්තර හෝ කඩදාසි එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 28. | පා පැදි , යතුරු පැදි හා මෝටර් වාහන අලුත්වැඩියා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 29. | විසිරි පින්තාරු කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 30. | ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිෂ්පාදනය හා ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 31. | ලෝහ සංස්කාර්යය කර්මාන්ත යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |

අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත

| | | | | |
|---|---|---|---|---|
| 1. | ඩ්‍රයි ක්ලීන් කිරීම හෝ සායම් දැමීම. | 500.00 | 750.00 | 1000.00 |
| 2. | රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම හෝ බතික් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 3. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 4. | ශීතකරණ අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 5. | තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 6. | හුණු ගල් හෝ හිරිගල් පිළිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 8. | ෆයිබර් නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 9. | බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 10. | ලෝහ වර්ග පෑස්සවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 11. | යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 12. | වාත්තු මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | මෝටර් වාහන බොඩි තැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | කෘමි නාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 16. | විෂබීජ නාශක නිපදවීම සහ මදුරු දඟර නිපදවිම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | දැව ආරක්ෂණ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 18. | ගල් තාර හා සිමෙන්ති ආශ්‍රිත පූර්ව සැකසුම් මධ්‍යස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 19. | වීදුරු භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 20. | යකඩ තහඩු ගැල්වනයිස් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 21. | පාස්සන ඊයම් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 22. | ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 23. | කටු කම්බි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | කම්බි ඇණ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 25. | කාබන් කඩදාසි හෝ යතුරු ලියන රිබන් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 26. | බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 27. | ජී.අයි.බාල්දි නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 28. | වායු සමන යන්ත්‍ර, ශීතකරණ, අධි ශීතකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 29. | බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම හා අලුත්වැඩියා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 30. | යන්ත්‍රෝපකරණ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 31. | විදුලි භාණ්ඩ නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 32. | රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 33. | සංචායත බැටරි නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 34. | මෝටර් රථ වාහන එකලස් කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 35. | රේඩියේටර් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 36. | ඉලෙක්ට්‍රෝනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම. | 500.00 | 750.00 | 1000.00 |
| 37. | වියළි කෝෂ බැටරි නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 38. | විදුලි බුබුළු නිෂ්පාදනය සහ අළුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |

වෙනත් ව්‍යාපාර හෝ කර්මාන්ත

| | | | | |
|---|---|---|---|---|
| 1. | ආහාර පිණිස සතුන් ඝාතනය කිරීම හා ඝාතනය සඳහා රඳාව තබාගන්නා ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | ආහාර සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 3. | උත්සව ශාලා පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 4. | එළවළු පළතුරු විකුණන ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 5. | ගල් වලවල් සහ ගල් ඇඹරුම්හල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | තේ, කෝපි කඩ හා කෙටි ආහාර විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | නොමිලේ ආහාර බෙදාහැරීම පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8. | පෞද්ගලික ළිං පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 9. | මස් විකිණීම් ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | මාළු විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | රූපලාවන්‍ය මධ්‍යස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | ලැගුම්හල් හා නවාතැන්පලවල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | සංචාරක වෙළඳාම පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | සිල්ලර වෙළඳසැල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | හෝටල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 07. 2023 වර්ෂය සඳහා කර්මාන්ත බදු යෝජනාව සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**<u>යෝජනාව</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කර ගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ 11 වන තීරුවේ එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023වර්ෂයේ මාර්තු 31 වන දිනට පෙර එම බද්ද යටියන්තොට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

| | 1 වන තීරුව | 11 වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්ත | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු.750.00 නොඉක්මවන අවස්ථාවක | රු.750.00 ඉක්මවන , එහෙත් රු.1500.00 නොඉක්මන අවස්ථාවක | රු.1500.00 ඉක්මවන අවස්ථාවක |
| 1. 01 | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 2. 02 | කුෂන් වැඩපළක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 3. 04 | වීදුරු අල්මාරි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 4. 05 | හඳුන්කූරු නිෂ්පාදනය. | 500.00 | 750.00 | 1000.00 |
| 5. 06 | කෘතිම මල් සෑදීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. 09 | මිනිරන් පතලක් පවත්වාගෙන යාම හා තලාතු මිනිරන් සකස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. 12 | තීන්ත වර්ග නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 8. 14 | යකඩ පුටු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 9. 15 | තේ කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 10.16 | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 11.18 | යන්ත්‍ර නොමැතිව පාවහන් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 12.20 | අභ්‍යාස පොත් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 08. 2023 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**<u>යෝජනාව</u>.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2023 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම්, මෙහි පහත උපලේඛනයේ 1 තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 11වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමානය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එම බද්දට යටත් යම් තැනැත්තකු එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ මාර්තු මස 31 වන දිනට පෙර යටියන්තොට ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

උපලේඛනය

| 1 වන තීරුව<br>බද්දට අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ<br>ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | 11 වන තීරුව<br>ගෙවිය යුතු බද්ද<br>රු. ශත |
|---|---|
| 1.රු.6000 නොඉක්මවන විට | නැත |
| 2.රු.6000 ඉක්මවන නමුත් රු.12,000 නොඉක්මවන විට | 90.00 |
| 3.රු.12000 ඉක්මවන නමුත් රු.18,750 නොඉක්මවන විට | 180.00 |
| 4.රු.18750 ඉක්මවන නමුත් රු.75,000. නොඉක්මවන විට | 360.00 |
| 5.රු.75000 ඉක්මවන නමුත් රු.150,000 නොඉක්මවන විට | 1200.00 |
| 6.රු.150000 ඉක්මවන විට | 3000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 09. 2023 වර්ෂය සඳහා සතිපොල ගාස්තු අයකිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 119 වැනි වගන්තිය ප්‍රාකාරව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සතිපොළවල් වලින් පහත සදහන් ආකාරයට 2023 වර්ෂය සඳහා ගාස්තු අයකිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| 1.අඩි 8X 6 කාමරයක් සදහා | = රු.250.00 |
| 2. අඩි 6X 6 කාමරයක් සදහා හා වාහන තුළ වෙළදාම | = රු.200.00 |
| 3.පදික තාවකාලික | = රු.100.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 10.2023 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම්( දෘශ්‍ය පරිසරය)ගාස්තු අය කිරිම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**යෝජනාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යාස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයා විසින් 1988.08.23 දිනැති අංක 520/7 දරන පළාත් පාලන අතිවිශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) වැනි කොටසේ ප්‍රකාශයට පත්කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාව යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් 2012/01/13 දින වැළඳ ගැනීමට කටයුතු කර ඇති අතර එහි 39 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යටියන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන්, මාසයකට අඩු කාලයක් ප්‍රදර්ශනය වන තාවකාලික බැනර් හා දැන්වීම් පුවරු වර්ග අඩි 01 ක් සඳහා සහ ස්ථිර දැන්වීම් පුවරු වර්ග අඩි 01 ක් සඳහා 2023 වර්ෂයේදී පහත පරිදි බලපත්‍ර ගාස්තු උපරිමයට යටත්ව ගාස්තු අය කිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| **1.**තාවකාලික බැනර්,කටවුට් හා දැන්වීම් පුවරු සඳහා | වර්ග අඩියකට රු.25.00 |
| 2.ස්ථිර දැන්වීම් පුවරු සඳහා | වර්ග අඩියකට රු.50.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඞී.වසන්ත මැතිතුමා** (ඉ) 11.2023 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අය කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**<u>යෝජනාව</u>**

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය ප්‍රකාර පළාත් පාලන ආයතන වෙත බලය අභිනියෝජනය යටතේ යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ගාස්තු පහත පරිදි අයකිරීමට යෝජනා කරමි.

| අයිතමය | මුදල<br>රු. ශත |
|---|---|
| 1.පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත් ගාස්තුව | 100.00 |
| 2.පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව | 4500.00 |

3. පරීක්ෂණ ගාස්තු පහත සඳහන් පරිදි අය කරනු ලබන අතර අදාල සීමාව තුළ රජය විසින් පනවනු ලබන වෙනත් බදු මුදල් වේ නම් එයද මෙයට එකතු කරනු ලැබේ.

| ආයෝජන මුදල | පරීක්ෂා කිරීමේ ගාස්තු |
|---|---|
| 1.රු.250,000 හෝ ඊට අඩු නම් | රු 3,000.00 |
| 2.රු.250,001 රු.500,000 | රු.3,750.00 |
| 3.500,001 - රු.1,000,000 | රු.5,000.00 |
| 4.රු1,000,000 ට වැඩි නම් | රු.10,000.00 |

**පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර ස්ථාන**

1. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන (ලොන්ඩ්‍රි)
4. රෙදි වියන යන්ත්‍ර මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීම් හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත
5. දිනකට ලීටර 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වානිජ මට්ටමේ පොල් තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත
6. පොල් තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සරණය කිරීමේ කර්මාන්ත
7. දිනකට ලීටර් 100 කට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත මධ්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදන කිරීමේදී හෝ බෝතල් ගත කිරීමේ කර්මාන්ත
8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිති වියළි සැකසුම් ක්‍රියාවලිය සහිත වී මෝල්
9. මසකට කිලෝග්‍රෑම් 1000කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත අඹරුම්හල්
10. සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියලීමේ කර්මාන්ත හෝ දුම් වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරීමේ සහ සැකසුම් කිරීමේ කර්මාන්ත
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වානිජමය තේ මිශ්‍ර කිරීමේ/මුහුවම් කිරීමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5 හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250 ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වානිජ මට්ටම් බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05ක හෝ ඊට වැඩි සහ 10ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25ක් හෝ ඊට වැඩි සහ 50ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්
19. වැඩුණු සතුන් මුළු එකතුව 100ක් හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවල්
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
23. දිනකට නිෂ්පාදන ධාරිතාව මෙට්‍රික් ටොන් 20ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු
24. සේවක සංඛ්‍යාව 05කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරීමේ /පතුරු කිරීමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව විදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත
29. පුපුරන ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීමේ කටයුතු
30. දිනකට ඝන මීටර් 25ට අඩු ඉරුම් ධාරිතාවක් සහිත ලීමෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත
31. දැව පදම් කිරීම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භවිතා කරන කර්මාන්ත
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත
33. සේවක සංඛ්‍යාව 05ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ වැඩි සහ 20ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙළ කිරීමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා
34. පදිංචි සංඛ්‍යාව දිනකට 25 ක් හෝ ඊට වැඩි සහ 100 ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකගාර හෝ එවැනි ලැගුම්හල්
35. විසිරි පින්තාරු කිරීම් හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩිය කිරීම්, නඩත්තු කිරීම් හෝ සවි කිරීම් සිදු නොකරන වාහන අලුත්වැඩිය කිරීමේ හෝ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ්
36. වාහන සේවා සිදු නොකරන බහාලුම් (කන්ටේනර්) පර්යන්ත
37. ඊයම් උණු කිරීම අතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර
38. මෘත ශරීර කල් තබා ගැනීමට සකස් කිරීම සහිත මල් ශාලා
39. මෙම උපලේඛනයේ "ඇ" කොටසේ ඇතුලත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩ සහ 50ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක් /කර්මාන්තයක්

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 12. 2023 වර්ෂය සඳහා මෘත දේහයක් ආදාහනය කිරීමේ ගාස්තු අය කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**<u>යෝජනාව</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 126 වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 2012.01.13 වැනි දිනැති අංක 1741 දරන වැනි පළාත් පාලන ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ පළකරන ලද යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරය පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 17 වැනි වගන්තිය ප්‍රකාරව ස්ථිර පදිංචිය යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ අයෙකුගේ මෘත ශරීරය ආදාහනය සඳහා ගාස්තුව සහ ස්ථිර පදිංචිය බල ප්‍රදේශයෙන් පිටත වූ අයෙකුගේ මෘත ශරීරය ආදාහනය සඳහා ගාස්තුව පහත පරිදි පනවා 2023 වර්ෂය සඳහා අයකිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය අය සඳහා හා කොවිඩ් මෘත දේහ සඳහා =9500+(A-10016)0.4
යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට ස්ථිර පදිංචි කොවිඩ් නොවන මෘත දේහ සඳහා =9500+(A-10016)0.4+500
(මෙහි A යනු 37.5Kg ගෑස් සිලින්ඩරයක් මිලදී ගත් මුදල වේ.)
ආදාහනාගාරයේ අළු තැන්පත් කිරීම සඳහා කුටි වෙන් කිරීම =රු.20000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 13)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
**(ඉ) 13.** 2023 වර්ෂය සඳහා සභාව සතු භූමිය කුලියට දීමේදී ගාස්තු අය කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා.

**<u>යෝජනාව</u>**

යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් භූමි කුලියට ලබා දීමේ ගාස්තු පහත පරිදි පනවා 2023 වර්ෂය සඳහා අයකිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

1. **ක්‍රීඩා පිටිය දින 1ක් සඳහා**

| | | |
|---|---|---|
| 01. ක්‍රීඩා සමාජ සඳහා කුලියට දීම | - | රු.5000.00 |
| 02. සංගීත සංදර්ශන,වෙළඳ ප්‍රදර්ශන | - | රු.8000.00 |
| (අලාභ/ ජල, විදුලි භාවිතා වී නම් ප්‍රතිපූර්ණයට යටත්ව ආපසු ගෙවන තැන්පතුව ) | - | රු.20000.00 |
| 03. හෙලිකොප්ටර් ගොඩ බැස්සවීම. | - | රු.5000.00 |
| 04 . සියලුම පෞද්ගලික රැස්වීම් | - | රු .5000.00 |
| (අලාභ/ ජල, විදුලි භාවිතා වී නම් ප්‍රතිපූර්ණයට යටත්ව ආපසු ගෙවන තැන්පතුව ) | - | රු.20000.00 |
| 05. කිතුල්ගල සතිපෙළ (පොළ නොපැවත්වෙන) දින 1ක් සඳහා | - | රු. 5000.00 |
| (අලාභ/ ජල, විදුලි භාවිතා වී නම් ප්‍රතිපූර්ණයට යටත්ව ආපසු ගෙවන තැන්පතු ) | - | රු. 10000.00 |
| 06. රජයේ ආයතන සම්බන්ධ අවස්ථා | - | රු. 2000.00 |
| 07.බල ප්‍රදේශයේ පාසල් ක්‍රීඩා තරග හෝ රාජ්‍ය උත්සව | - | නිදහස |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ගරු සභාපතිතුමනි,මට කාරණයක් දැන ගැනීමට අවශ්‍යයි. ඒ නිසා ගරු මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

*.ගරු මහ සභාව ප.ව 12.45 පමණ කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, කාරක සභාව ගරු මහ සභාවක් බවට පත් කිරීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

*ගරු මහ සභාවට ප.ව 12.55 ට පමණ මහ සභාවක් බවට පත් විය.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 13)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 14. 2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබාදීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා. **යෝජනාව**

යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබාදීමේ ගාස්තු 2023 වර්ෂය සඳහා පහත පරිදි පනවා අය කිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනාව කරමි.

| වාහන හා යන්ත්‍රෝපකරණ | | ගාස්තුව |
|---|---|---|
| 01.ජේ.සී.බී යන්ත්‍රය | | මීටර් පැයකට රු.6500.00 |
| 02.ටිපර් රථය | - | පැය 8ට වැඩි පැය 24 දක්වා ස්ථාවර අයකිරීම - රු.12000.00<br>ධාවනය කරන මුල් 15Km සඳහා රු. 7000.00<br>වැඩි වන සෑම කි.මී 1ක්සඳහා රු.200.00 |
| 03.ගලි බවුසරය | | එක් බවුසරයක් සඳහා සේවා ගාස්තුව රු. 8500.00<br>(ධාවනය කරනු ලබන මුල් කි.මී 05 ක් සඳහා රු.1000.00<br>බැගින් හා බැහැර කිරීම දක්වා වැඩි සෑම කි.මී 1ක් සඳහා 150.00 අය කරනු ලැබේ)<br>ප්‍රවාහන ගාස්තුවට අමතරව බැහැර කිරීමට ස්ථාන සපයා නොදෙයි නම් ඒ සඳහා තෙවන පාර්ශවය අයකරන අදාල වේ. |
| 04.ජල බවුසරය(2500L ) | | ජලය සමග ජල බවුසරය රු.1500.00 + ජල ගාස්තු<br>ජල බවුසරය රඳවා තබා ගන්නා එක් රාත්‍රියකට සහ ඊට වැඩිවන වරුවක් සඳහා රු. 1000.00බැගින්<br>(ධාවනය කරනු ලබන මුල් කි.මී 05 ක් සඳහා රු.1000.00<br>ද වැඩි වන සෑම කි.මී 1ක් සඳහා 150.00 අය කරනු ලැබේ) |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.ඩී. ඥානවති මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 14)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 15. 2023 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වෙනත් කුලී/සේවා සහ පෝරම ගාස්තු අය කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**<u>යෝජනාව</u>**

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ වෙනත් කුලී/සේවා සහ පෝරම ගාස්තු අය කිරීම 2023 වර්ෂය සඳහා පහත පරිදි පනවා අය කිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

| විස්තරය | ගාස්තුව |
|---|---|
| 01.කොඩිකණු 01 | දිනකට රු.10.00 } තැන්පතුව රු. 2000.00 |
| 02.පුටුවක් (ප්ලාස්ටික් ) | දිනකට රු.5.00 } තැන්පතුව රු. 2000.00 |
| 04.බිම් කුලියට දීම | දිනකට රු.2500.00 |
| 05.මාර්ග පළුදු කිරීම | (මුල්වර්ග අඩි 08 -රු.2000.00,වැඩිවන සෑම වර්ග අඩියකටම රු.500.00 බැගින් රු. 2000ට වඩා වැඩි වන මුදල මාර්ගය යථා පරිදි පිළිසකර කළ පසු ඉල්ලීම මත නිදහස් කරනු ලැබේ. |
| 06.කලුගල්/වැලි ප්‍රවාහනය (මාර්ග මත) | වාර්ෂික රු.1000.00 බැගින් (මාර්ග හානි ප්‍රතිපූර්ණය සඳහා කාර්මික නිලධාරි නිර්දේශ මත මුදලින් වාර්ෂිකව තැන්පතුවක් තැබීමට යටත් වේ.) |
| 07.දැව ප්‍රවාහනය(මාර්ග මත) | |
| ට්‍රැක්ටරයක් සඳහා එක් ගමන් වරකට | රු. 100.00 |
| ලොරි , ටිපර්, ට්‍රක් රථයක් එක ගමන් වරකට | රු .200.00 |
| ඇතුන් ලවා දැව කඳන් ඇද්දවීමට එක් දිනකට | රු. 500.00 |

මෙහි දැක්වෙන ගාස්තු සමඟ ඒ ඒ කාර්ය සඳහා බලය පවරන ලද නිලධාරියා විසින් තක්සේරු කල ඇප මුදලක් ලබා දිය යුතුය. ඇප මුදලින් 10% ක් ආපසු නොගෙවන දෙපාර්තමේන්තු ගාස්තුවකින් හා මාර්ග අලාභ ප්‍රතිපූර්ණය සඳහා තක්සේරු ගාස්තුවකට ඇතුළත්වේ.

| | |
|---|---|
| 08. කොම්පෝස්ට් පොහොර | ඒකක 2ක පැකට් සඳහා රු. 50.00(දළ බර 2Kg)<br>(පැකට් නොකරන ලද) අලෙවි කරන ලද අවස්ථාවේදී කි.ග්‍රෑම් 1ක් සඳහාරු. 18.00<br>අලෙවි කරන අවස්ථාවේදී කි.ග්‍රෑම් 1000ට වැඩි වන ප්‍රමාණය සඳහා රු. 15.00 බැගින් |
| 09. කොණ්ඩා කැපුම් ව්‍යාපාර වලින් කසල ඉවත් කිරීම | මසකට රු. 600.00 |
| 10. ව්‍යාපාරික ස්ථාන වලින් කසල ඉවත් කිරීම | මාසිකව රු. 1000.00 |

**පෝරම ගාස්තු**

| | |
|---|---|
| 01. වීථිරේඛා නොපවරා ගැනීමේ අයදුම්පත් ගාස්තු | - රු. 20.00 |
| 03. මිනින්දෝරු සැලසුම අනුමත කිරීම අයදුම්පත් ගාස්තු | - රු. 20.00 |
| 04. ගොඩනැගිලි අයදුම්පත් | - රු. 600.00 |
| 06. ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබා ගැනීමේ අයදුම්පත් ගාස්තු | - රු. 50.00 |
| 07. වීථිරේඛා නොපවරා ගැනීමේ සහතික ගාස්තු | - රු.1500.00 |
| 08. මිනින්දෝරු සැලසුම අනුමත කිරීම ,කට්ටි සැලසුම් අනුමත කිරීම ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම ,ගොඩනැගිලි අවසර පත්‍රයේ කාලය දීර්ඝ කිරීම අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා පෙරසැරි ගාස්තු අය කිරීම | ජාතික රාජ්‍ය සභාවේ අංක 41 නාගරික සංවර්ධන පනත යටතේ පනවන ලද රෙගුලාසි වල |

ඇතුලත් ගාස්තු අය කරනු ලබයි.
( අංක 2235/54 දරන 2021 ජුලි 08
ගැසට් පත්‍රය)

09. නාගරික සංවර්ධන බල ප්‍රදේශයෙන් පිට ගොඩනැගිලි සැලසුම් හා ඉඩම් අනුබෙදීම් පිඹුරු අනුමැතිය සඳහා ආවරණ අනුමැති ගාස්තු සඳහා - අංක 2235/54 දරන 2021 ජුලි 08 ගැසට් පත්‍රයේ සඳහන් ජාතික රාජ්‍ය සභාවේ අංක 41 නාගරික සංවර්ධන පනත යටතේ පනවන ලද රෙගුලාසි වල ඇතුලත් පරිදි ගාස්තුවෙන් අඩකි.

07. අනතුරුදායක ගස් ඉවත්කිරීමේ අයදුම්පත් ගාස්තු - රු.20.00
අනතුරුදායක ගස් පරීක්ෂා කර නිර්දේශ ලබා දීමේ ගාස්තු කොස් ගස් 02 දක්වා හෝ වෙනත් ගස් 04 ක් දක්වා රු. 1000.00
වැඩිවන කොස් ගස් 01 හෝ වෙනත් ගස් 02ක් සඳහා රු. 500.00 බැගින්

| | | | |
|---|---|---|---|
| 08 .පුස්තකාල සාමාජික අයදුම්පත් ගාස්තු | - | රු. | 20.00 |
| 09. පුස්තකාල සාමාජිකත්වය ලබාදීම සඳහා | - | රු. | 200.00 |
| 10. පුස්තකාල සාමාජිකත්ව අලුත්කිරීම | - | රු. | 50.00 |
| 11. පොත් ප්‍රමාද ගාස්තු දිනකට | - | රු. | 2.00 |
| 12. පා පැදි බලපත්‍ර ගාස්තු | - | රු. | 4.00 |
| 13. පා පැදි බලපත්‍ර පෝරම ගාස්තු | - | රු . | 6.00 |
| 14. වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ අයදුම්පත් ගාස්තු | - | රු | 1000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 15)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 16. 2023 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා

<u>යෝජනාව</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර පහත උප ලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාලව පනවා අය කිරීමට යටියන්තොට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි.

| උපලේඛන | රු.ශත |
|---|---|
| මෝටර් රථයක් ,මෝටර් ට්‍රයිසිකලයක් ,මෝටර් ලොරි රථයක්, මෝටර් බයිසිකලයක් කරත්තයක් ජින් රික්ෂෝවක් බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා | |
| (අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ) වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් | 4.00 |
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයකු හෝ පෝනියකු හෝ කොටලුවකු සඳහා | 15.00 |
| සෑම ඇතෙකු සඳහා | 50.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 16)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 17. 2023 වර්ෂය සඳහා බදු පැනවීමේ යෝජනාව සභා සම්මත කර ගැනීමෙන් අනතුරුව ත්‍රෛභාෂිකව ගැසට් කිරීමට දෙමළ හා ඉංග්‍රීසි මධ්‍යයට පරිවර්තනය කිරීමටත්, පරිවර්තකයන් හට අංක 12/2003( iii) චක්‍රලේකයට අනුව ගෙවීම් කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 17)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 18.** යටියන්තොට ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය ඒකකය මගින් මලල්පොල ප්‍රජා ශාලාවේ පවත්වනු ලබන ආයුර්වේද වෛද්‍ය සායනය සඳහා ඖෂධ සහ වෛද්‍යවරුන් ප්‍රවාහනය වෙනුවෙන් SGYR 9710 අංක දරන ත්‍රිරෝද රථ රියදුරුට මසකට වාර දෙක බැගින් රු.2600.00 ක මුදලක් ගෙවනු ලබයි.නමුත් වර්තමානයේ පවතින ඉන්ධන සහ අනෙකුත් අමතර කොටස් හා සේවා මිල ඉහල යාම හේතුවෙන් එම මුදල ප්‍රමාණවත් නොවන බව දන්වා ඇත.එබැවින් මසකට රු.5000.00 ක මුදලක් 2022 සැප්තැම්බර් මාසයේ සිට ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 18)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 19. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කිරීමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘති වලට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියක් අනුමත සමිතියක් මගින් ඉටු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

1.කලටුවාව කාබනික පොහොර මධ්‍යස්ථානයේ පොහොර හලන ස්ථානය
 අසල කොන්ක්‍රීට් කිරීම - රු.253,000.00
2.දොඹේපොල ගමට පිවිසෙන මාර්ගය මුල් කොටස සංවර්ධනය කිරීම - රු.200,000.00
3.ආදාහනාගාරයේ විම්ණිය කොටස කපරාදු කිරීම - රු.104,225.58
4.මහබාගේ ඉහල තුන්පැල බටේ මාර්ගය දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම
 (සංශෝධිත ඇස්තමේන්තුව) - රු.499,799.94

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 19)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා ඔබගේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා**

(ඉ) 20. යටියන්තොට ප්‍රදේශයේ මේ වන විට මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අවදානම් තත්වයක් වැඩිපුර අසන්නට ලැබේ.ඒ පිළිබඳව ගරාගොඩ කොට්ඨාශයේ තරුණ ප්‍රජාව හා දෙමාපියන් දැනුවත් කිරීමට හා ළමා අපයෝජන පිළිබඳව වැඩමුළුවක් ගරාගොඩ කොට්ඨාශය ඉලක්ක කරමින් ඔක්තොම්බර් මාසය තුළ ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා රු.25000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ජී.ප්‍රසාදිකා දිල්සානි මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.මේක ඇත්තටම හොඳ යෝජනාවක් යටියන්තොට හා කිතුල්ගල නගරවල පාසල් මූලික කරගෙන මාසයකට වරක්වත් තරුණ ප්‍රජාවට දෙමාපියන් සමඟ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් පැවැත්වුවහොත් හොඳයි.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි,යටියන්තොට බල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය වැඩිවෙලා තියෙනවා. පාසල් ළමුන් මතට ඇබ්බැහිවෙලා ඉන්නේ,දැනුවත් කිරිමේ වැඩසටහන් කීපයක් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න මැතිතුමා** ගරු සභාපතිතුමනි,මත්ද්‍රව්‍ය වැඩසටහන් යටියන්තොට බල ප්‍රදේශය ආවරණය කරගෙන පවත්වමු.

**ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ලාල් මන්ත්‍රීතුමාගේ යෝජනාව කාලෝචිතයි.සෑම පාසලකම ළමුන් කීපදෙනෙක් මේවට යොමු වෙලා ඉන්නේ.මත්ද්‍රව්‍ය ඉතාමත් ප්‍රභලවම තියෙනවා.පොලීසියටත් අල්ලන්න අමාරුයි.තරුණ ප්‍රජාව දැනුවත් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි,පොළ භූමිය පිටුපස විශාල වශයෙන් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන අය ඉන්නවා.පුළුවන්නම් ගේට්ටුව වලට ඉබියතුරු දාලා වහලා තියන්න.තරුණ ප්‍රජාවට යටියන්තොට බල ප්‍රදේශය තුළ මෙම වැඩ සටහන කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි,පුරනැගුම ගොඩනැගිල්ල ආසන්නයේ සිද්ධ වෙන අකටයුතු පිළිබඳ හොඳ අවධානයෙන් ඉන්න.පුන්සිරි කඩේ ළඟින් වහලා පිළියලක් කරන්න .මත්ද්‍රව්‍ය විතරක් නොවෙයි තවත් දේවල් සිද්ධ වෙනවා. මේ සඳහා කුමන හෝ ක්‍රියාමාර්ගයක් ගන්න.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත (ඉ) 20 යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 20 යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 20)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 21. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව රාජ්‍ය ආයතන සතු වත්කම්වලට අදාළ තොරතුරු පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කළ යුතුය. ඒ අනුව මෙම ආයතනයේ ස්ථාවර වත්කම් තක්සේරු කිරීමේ කාර්යයට 2017.08.16 දිනැති සබරගමුව පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 04/2017 අනුව පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත කමිටු පත්කර ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.

1.ඉඩම් තක්සේරු කමිටුව

I. තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරි
II. සභාවේ ලේකම්වරයා
III. සභාවේ කාර්මික නිලධාරිවරයෙක්

2.ගොඩනැගිලි තක්සේරු කමිටුව

I. තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරි
II. සභාවේ ලේකම්වරයා
III. සභාවේ කාර්මික නිලධාරිවරයෙක්

3.මෝටර් රථ තක්සේරු කමිටුව

I. මෝටර් රථ පරීක්ෂක/පළාත් යාන්ත්‍රික ඉංජිනේරු
II. සභාවේ ලේකම්වරයා
III. සභාවේ කාර්මික නිලධාරිවරයෙක්

4.යන්ත්‍ර සූත්‍ර තක්සේරු කමිටුව

I. මෝටර් රථ පරීක්ෂක/පළාත් යාන්ත්‍රික ඉංජිනේරු
II. සභාවේ ලේකම්වරයා
III. සභාවේ කාර්මික නිලධාරිවරයෙක්

5.පරිගණක තක්සේරු කමිටුව

I. පරිගණක විෂය හා සම්බන්ධ රජයේ පත්වීම්ලත් ගුරු සේවයේ නිලධාරියෙක්/තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරියෙක්
I. සභාවේ ලේකම්වරයා
II. සභාවේ කාර්මික නිලධාරිවරයෙක්

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 21)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 22. කලටුවාව කාබනික පොහොර මධ්‍යස්ථානයේ හරිතාගාරයක් සකස් කිරීම සඳහා In & Out micro irrigation ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පවත්නා වෙළඳපල තත්ත්වය යටතේ සාධාරණ මිල වටිනාකම් එම ආයතනය ක්ෂේත්‍ර තුළ ප්‍රමාණවත් අත්දැකීම් සහිත සහ ඉදිරි කාලයේදී අඛණ්ඩව අවශ්‍ය සහය ලබා ගැනීමට විශ්වාසවන්ත ආයතනයක් බවත්, එම ආයතනය මගින් අවශ්‍ය සවිකර ගැනීම්, අවශ්‍ය උපාංග කොටස් සපයා ගැනීම තාක්ෂණිකව වඩා ප්‍රතිඵලදායක බවත් යටියන්තොට කෘෂිකර්ම උපදේශ කාර්යාලයේ කෘෂිකර්ම උපදේශක විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව පහත සඳහන් පරිදි සෘජු සපයා ගැනීම් යටතේ In & Out micro irrigation ආයතනය වෙතින් හරිතාගාරය සකස් කර ගැනීමටත්, ඊට අදාළ බිල්පත සහා අරමුදලින් ගෙවීම් කිරීමටත් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

1. 20 x 50 Green House Sheltering 95,000.00
2. 20 x 50 Green House –Irrigation System 98,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 22)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 23. යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් SGGK 0627 දරන කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් නෙතුන් හොල්ඩින්ස් සර්විස් සෙන්ටර් වෙත රු.27,350.00ක බිල්පත ගෙවීම් කිරීමට ද SGRD 5111 දරන ට්‍රැක්ටර් රථය සේවා කිරීම වෙනුවෙන් C.N.S සර්විස් සෙන්ටර් වෙත රු.50,165.00 ක බිල්පත ගෙවීම් කිරීමට ද ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 23)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 24. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු WPZA 5057 දරන බැකෝ යන්ත්‍රයේ පහත අලුත්වැඩියාව සිදු කිරීම වෙනුවෙන් රු. 368,786.61 ක වටිනා ඇස්තමේන්තුව සඳහා සහා අරමුදලින් ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා

විස්තරය
1. ස්ටාර්ට් මෝටරයට අදාල - Relay
2. Air Filter
3. Engine Oil Sense Tuck Of 6CTA8.3 Diesel
4. Engine Cooling Fan
5. Accelerator Cable

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 24)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 25. සභාවට අයත් පුරනැගුම වෙළඳ සංකීර්ණය අසල රථගාලක් ලෙස පවත්වාගෙන යාමට අපේක්ෂා කල ස්ථානය මීට පෙර බදු ගැනුම්කරුවකු ලබා ගෙන තිබුණද සේවා පවත්වාගෙන යාමට නොහැකි බව දැන්වීම නිසා 2021.11.01 දින සිට ගිවිසුම අවලංගු කරන ලදී.ඉන් පසු කාර්ය මණ්ඩලයේ අයෙක් යොදවා සේවා හා ආදායම් එක්රැස් කිරීම් ක්‍රියාත්මක කිරීමට උත්සහ කලද එයද අසාර්ථක වී ඇත.නමුත් මෙම ස්ථානය පවත්වාගෙන යාම සඳහා යටියන්තොට පහළ ගරාගොඩ නො.220/4 ලිපිනයේ එස්.සිවගුරුනාදන් මහතා විසින් ඉල්ලීමක් කර ඇත.ඒ අනුව මෙම ස්ථානය ඉදිරි මාස 03 අවසාන බදු ගිවිසුමේ ලංසු මුදල මත ඉල්ලුම්කරුට ලබා දීමටත් එම මාස 03 සඳහා ගිවිසුම් ගත වීමටත් මුල් මාස දෙකෙහි බදු කුලී මුදල ආරක්ෂිත තැන්පතුවක් ලෙස ගිවිසුම්

ගත වීමේදි ලබා ගැනීමටත් 2023 වර්ෂය සඳහා සාමාන්‍ය වාර්ෂික බදු ක්‍රියාවලිය ආරම්භ කිරීමටත් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 25)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 26. යටියන්තොට මාලු වෙළඳසැල ,කිතුල්ගල මාලු වෙළඳසැල ,කිතුල්ගල ඔරු තොටුපළ,ගරාගොඩ ගලපල්ලවත්ත සුසාන භූමිය තුල එලදාව නෙලීම බදු දීම,පුරනැගුම වෙළඳ සංකීර්ණය ඉදිරිපිට රථ ගාල බදු දීම යන දේපල ස්ථාන 2023 වර්ෂය සඳහා පෙර වර්ෂයේ ටෙන්ඩර් වූ මුදල මෙම වර්ෂයේ අවම ලංසුව ලෙස තබා ටෙන්ඩර් කිරිමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 26)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 27. පුරනැගුම වෙළඳ සංකීර්ණයේ මේ වන තෙක් දිගුකාලීන බදු පදනම යටතේ බදු දීමට නොහැකි වී ඇති කඩ කාමර අංක 2,3,4 දිගු කාලීනව බදු දීමට අවස්ථා කිහිපයකදී උත්සහ කලද එය ඉටු කර ගැනීමට නොහැකි වී ඇති නිසා පලාත් පාලන චක්‍රලේඛ 3/2020 අනුව මාසික කුලිය යටතේ බදු දීම සඳහා සලකා බැලීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස් ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.2023 වර්ෂයේ බදු කටයුතු යටතේ මෙය ඉටු කරමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව අනුව 2023 වාර්ෂික බදු ක්‍රමය යටතේ ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 27)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 28. වී ඔය පිදුරුවැල්ල මාර්ගයේ අබලන්ව ඇති බෝක්කුවක් ඉදි කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවක් ලෙස හඳුනා ගෙන ඇත.ඒ සඳහා අවශ්‍යය ද්‍රව්‍ය ලබා දීමට යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර ඇත.මේ සඳහා වියදම් ඇස්තමේන්තුවක් සකස් කර කාර්ය ඉටු වූ පසු බිල්පත් මඟින් වටිනාකම් ලබා ගැනීමටත් හියුම් පයිප්ප හා මෙටල් ගල් අවශ්‍ය ප්‍රමාණයට මිල කැඳවා සපයා ගෙන වසමේ ග්‍රාම සංවර්ධන සමිතියට භාර දී ගිවිසුම් ගතව කාර්යය ඉටු කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

අවශ්‍ය ද්‍රව්‍ය

1. විශ්කම්භය අඩි දෙකක් වන සිලින්ඩර අඩි - 24
2. සිමෙන්ති මිටි - 15
3. ¾ මෙටල් කියුබ් - 01

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 28)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 29. මුදල් අමාත්‍යාංශය මගින් 2022.04.26 වන දින එවා ඇති ලිපියට අනුව අංක 03/2022 චක්‍රලේඛයට අනුව ආදායම් පරීක්ෂක ආර්.ජී.චාමර මදුසංඛ මහතාට ගමන් වියදම් දීමනාව ලබා දීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස් ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 29)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 30.අප සභාවේ සේවය කරන වැඩක්ෂේත්‍ර කම්කරු ඒ.පී.ටී.එම්.පතිරණ මහතා ආපදා ණය මුදලක් (රු 250,000.00) ඉල්ලීම් කර ඇත.එම මුදල සභා අරමුදලින් ගෙවීම් කිරිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 30)**

**හදිසි යෝජනාව**

**ගරු සභාපති කේ.ඩී. වසන්ත මැතිතුමා (ඉ) 31.** ලෝක ළමා දිනය හා සාහිත්‍ය මාසයට සමගාමීව කිතුල්ගල ප්‍රභාෂ්වර ළමා සමාජයේ ඉල්ලීම මත ,ප්‍රභාෂ්වර ළමා සමාජය,මිරිස්සවල ළමා සමාජය හා මහවිල පෙර පාසලේ ඉගෙනුම ලබන දරුවන් සඳහා පාසල් අභ්‍යාස පොත් ලබා දීමට වැය ශීර්ෂය 607(1) 6 යටතේ රු.90000.00 ක මුදලක් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සහා අරමුදලින් වියදම් දැරිම සඳහාත් ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 31)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 32**. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කිරිමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියක් අනුමත සමිතියක් මගින් ඉටු කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
1.මහවිල වෙරළුගොල්ල මාර්ගය සංවර්ධනය කිරිම - රු.500,000.00
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 32)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 33.** 2022 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ 1.3.4.2 උප ක්‍රියාකාරකම් යටතේ කාර්යාලයේ ආරක්ෂිත ගේට්ටුව සකස් කිරිම සඳහා ද්‍රව්‍ය සපයා ගැනීමට අදාළව 2022.09.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව පහත සඳහන් පරිදි ද්‍රව්‍ය සපයා ගැනිමටත් .ඒ වෙනුවෙන් ගෙවීම් කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| අනු අංකය | ආයතනයේ නම | බිල්පත් වටිනාකම |
|---|---|---|
| 1 | සෙන්ට්‍රල් හාඩ්වෙයාර් | 191,990.00 |
| 2 | නිල්ෆා හාඩ්වෙයාර් | 16,250.00 |
| 3 | නවලංකා හාඩ්වෙයාර් | 10,000.00 |
| | | 218,240.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 33)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 34 . 2022.09.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව කාර්යාලයෙහි සහ මහජන පුස්තකාලවල ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය පහත සඳහන් පරිදි සපයා ගැනීමටත්, ඒ වෙනුවෙන් ගෙවීම් කිරීමටත් ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

| අනු අංකය | ආයතනයේ නම | බිල්පත් වටිනාකම(රු) |
|---|---|---|
| 01 | නිව් ජෙනරල් ට්‍රේඩින් | 277,729.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 34)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 35. කාර්යාලයෙහි සහ සෞඛ්‍ය අංශයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සීමාසහිත යටියන්තොට විවිධ සේවා සමූපකාර සමිතිය වෙතින් සපයා ගැනීම වෙනුවෙන් රු.133,240.00ක බිල්පත ගෙවීම් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 35)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 36.අප සභාවේ සේවය කරන සංවර්ධන නිලධාරි ආර්.එච්.සී.එන්.සෙනෙවිරත්න මහත්මිය විසින් ආපදා ණය මුදලක් (රු 60000.00) ඉල්ලීම් කර ඇත.එම මුදල සභා අරමුදලින් ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 36)**

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**
* 2022 අගෝස්තු මස අභ්‍යන්තර විගණන වාර්තාව

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**
01.2022 අගෝස්තු මස වියදම් වාර්තාව
02.2022 ජූලි,අගොස්තු මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
03.2022 ජූලි,අගොස්තු මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
04.2022 ජූලි,අගෝස්තු මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

**(ඌ) වෙනත් කරුණු**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි,යටියන්තොට බල ප්‍රදේශය තුළ වැඩිහිටි දීමනාව ලබා දී ඇති අය දීමනාව ලබා ගැනීම සඳහා ළගම ඇති තැපැල් කාර්යාලයට අනුයුක්ත කර තිබුණි.නමුත් මේ වන විට මෙම දීමනාව ලබා ගැනීමට යටියන්තොට සමෘද්ධි සංවර්ධන බැංකුවට පැමිණීමට සිදුව ඇත.ඔවුන්ට ලැබෙන්නේ රු.1900 ක් පමණි.නමුත් ත්‍රිවිල් රථයක පැමිණීමට රු.2000 ක මුදලක් අය කරයි. ඒ අනුව පොල්පිටිය,බෙරන්නාව.කිතුල්ගල,ගල්පාත සියළුම ග්‍රාම සේවා වසම් යටියන්තොටට ඒමට සිදු වේ.විශාල වියදමක් දැරීමට සිදු වන නිසා මේ අයට සහනයක් වශයෙන් ග්‍රාම නිලධාරින්.ආර්ථික සංවර්ධන නිලධාරින්,සමෘද්ධි නිලධාරින් මෙමම මුදල් ගෙවීමට කටයුතු කරන්නේ නම් වඩාත් උචිත බව මා සිතමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් ප්‍රේමසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි,බණ්ඩාර මැතිතුමාගේ අදහස කාලෝචිතයි.මෙම දීමනාව ගන්න සමෘද්ධි බැංකුවේ ගිණුමක් විවෘත කරන්න ඕන.මෙය ලොකු ගැටළුවක් වසමේ නිලධාරින් ඉන්නවා එයාටම පුළුවන් මේක නිවසටම ගෙනිහින් දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,මෙම ගැටළුව පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහින් කථා කරන්න.වසමේ නිලධාරින්ට කියන්න වයසක අයට නිවසටම ගිහින් දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි දිල්සානි ප්‍රසාදිකා මැතිනිය** ගරු සභාපතිතුමනි,සමහර සමෘද්ධි නිලධාරින් ගැනනම් කියන්න කනගාටුයි. ඇතැම් සමෘද්ධි නිලධාරින් මුදල් පවා ජනතාවගෙන් අරන් තියෙනවා. කීප දෙනෙක් ඉන්නවා ස්ථාන මාරු කරන්න ඕන.සමෘද්ධි නිලධාරින් පිළිබඳ සභාවේ අප්‍රසාදය පළ කරනවා කියලා ලිපියක් හදලා දාන්න.අපිත් අත්සන් කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,සෑම වසමකම නිලධාරින් 05 ක් විතර ඉන්නවා.මේ අදාල නිලධාරියාට වැඩිහිටි දීමනාව නිවසටම ගිහින් දෙන්න පුළුවන්. නමුත් සමහර සමෘද්ධි නිලධාරින් ඉන්නවා මුදල් වලට තමයි වැඩ කරන්නේ,නොළුවතුකන්දේ සමෘද්ධි නිලධාරි ගැන මම හැමදාම කියනවා.මේ අයව මාරු කරන්න ඕන. සභාපතිතුමා දැන් ලිපියක් හදලා දෙන්න අපි හැමෝම අත්සන් කරලා අදාල ආයතන ඔක්කොටම යවමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි,සමෘද්ධි නිලධාරින් ගොඩක් අය හොරකම් කරනවා.මේ අය ඔක්කොම මාරු කරන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි,සමහර සමෘද්ධි නිලධාරින් ගැන ජනතාව අප්‍රසාදයෙන් ඉන්නේ මේ අයට ස්ථාන මාරු කරන්න ලිපියක් සකස් කරන්න අපිත් ඒක අත්සන් කරලා දෙන්නම්.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි,සමෘද්ධි නිලධාරින් මාරු කරන්න සභාවක් විදිහට අපට ඉල්ලුම් කරලා ලිපියක් දෙන්න බෑ. සමහර නිලධාරින් වැරදි කරනවා ඇති.නමුත් හැමෝම නෑ.රජයෙන් එවන චක්‍රලේඛ ගැසට් අනුව තමයි වැඩ කරන්නේ,ඒ නිලධාරිනුත් ඉහළින් එන නියෝග තමයි පිළිපදින්නේ.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු මන්ත්‍රීතුමනි,අපට නිලධාරින් මාරු කරන්න කියලා ලිපි හදන්න බෑ.සභාවක් හැටියට අපට කරන්න පුළුවන් වැඩ කොටසක් තියෙනවා.

**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා එච්.පී.ප්‍රියන්ත පුෂ්ප කුමාර මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බව දන්වා සිටිනවා.එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බැවින් අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා.

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, වසර 05 ක් අපි ඔබතුමාට සහයෝගය දුන්නා.අපි පිරිතක් කියන්න තීරණය කළා ඒක කරගන්න බැරි වුණා.නමුත් අපේ සමරු එලකය සකස් කරන්න ඕන.

ළමා දිනය වෙනුවෙන් මේ පිරිතට යොදවන මුදල් යොදවලා අපි වැඩ සටහනක් කරමු.යටියන්තොට බල ප්‍රදේශයේ අසරණ ළමයි ගොඩක් ඉන්නවා.ඒ අයට යමක් කරන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ඒ.ප්‍රසාදිකා දිල්සානි මැතිනිය**
ගරු සභාපතිතුමනි,බල ප්‍රදේශයේ කන්න බොන්න නැති දරුවෝ ඉන්නවා.ආහාර අර්බුදය තදින්ම එයාලට බලපානවා.අපි හැමෝම එකතුවෙලා වැඩසටහනක් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි, වසමේ නැති බැරි දුප්පත් කණ්ඩායමක් තෝරාගෙන උදව්වක් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි,මේක එක්කෙනෙකුට දෙන්නෙකුට දීලා වැඩක් නෑ.මේකට වැඩ සටහනක් තෝරාගෙන ඔබතුමා කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න** ගරු සභාපතිතුමනි,පෙර පාසල් ළමයි ටිකක් තෝරාගෙන පාසල් ද්‍රව්‍ය ටිකක් දෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඒ.පී.ඩබ්.එම්.පී.ඩයනා උදයංගනි මැතිනිය** ගරු සභාපතිතුමනි,බල ප්‍රදේශයේ දුගී දුප්පත් ළමයින්ට මොනවා හරි කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි,පිරිතක් කියන්නේ මොකක්ද කියලා තේරුම් අරන් කථා කරන්න ඕන.පිරිතෙන් කියන්නේ ආධ්‍යාත්මික ගුණයක් ඇති වීමයි.පිරිතක් කියලා ළමා දිනයේ වැඩසටහන වෙනම කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමා, ගල්පාත ආයුර්වේද ජංගම වෛද්‍ය සායනය දැනට මසකට දෙවරක් පවත්වනු ලබයි.නමුත් ගල්පාත එගොඩමුල්ල ජනතාවගේ ඉල්ලීම පරිදි එක් දිනක් ගල්පාත එගොඩමුල්ල උපුල් සිසිර කුමාර අනුස්මරණ ප්‍රජා ශාලාවේ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් දනවමි.

*ගල්පාත ප්‍රදේශයේ ජනතාව ගමන් ගන්නා එගොඩමුල්ල රිටිගහඔය තොටුපල මාර්ගයේ ඇති ඒ දඬු දෙක ගල්පාත ගොඩපෙළ නාමල් ඇළ හරහා ඇති ඒ දණ්ඩ අළුත්වැඩියා කර දෙන ලෙස ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටියි. ඒ දඬු සඳහා භාවිතයට මාර්ග සංවර්ධන අධිකාරියේ ඇති යකඩ තහඩු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්,රිටිගහඔයේ ඇති රේල් පීලි ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් දන්වා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.පී ඥානවති මැතිනිය**
ගරු සභාපතිතුමනි,අමනාවල ප්‍රාදේශීය රෝහලේ රෝහල් වත්ත සුද්ධ පවිත්‍ර කර ගැනීමට අවශ්‍ය බව රෝහල් කමිටුව තීරණය කර ඇත.ඒ සඳහා සභාවේ කම්කරුවන් කීපදෙනෙක් ලබා දිය හැකි දිනයක් දන්වන ලෙස කාරුණිකව ඉල්ලමි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩයනා පාලමකුඹුර මැතිනිය**
ගරු සභාපතිතුමනි, වසර දෙකකට පසු නැවතත් ආරම්භ කරන ලද පොත් ප්‍රදර්ශනයෙන් යටියන්තොට මහජන පුස්තකාලයට හා අමනාවල මහජන පුස්තකාලවලට පොත් මිලදී ගැනිමට ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර සිටිමි.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

ගරු අල්විස් මැතිතුමා අසනිප තත්වයෙන් වුනත් මෙතනට පැමිණිලා තියෙනවා.එතුමා දක්ෂ මන්ත්‍රීවරයෙක් හැමෝම එක්ක සතුටින් හොඳින් සිටියා.සභාවේ ඕනම කටයුත්තකට අතහිත දුන්නා සබැම නායකයෙක් කියලා කියන්න පුළුවන්.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අල්විස් මැතිතුමා අපේ සභාවේ සිටින දක්ෂ මන්ත්‍රීවරයෙක් අද හොඳ තත්වයේ ඉන්නවා.අපි ඔක්කොමලා එකතුවෙලා ඔබ වෙනුවෙන් පෙනී සිටිනවා.අපි හැමෝම එකතුවෙලා වැඩ කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් ප්‍රේමසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, කිතුල්ගල කිරිකොහුතැන්න වසම් තුනම එකතුවෙලා මාර්ගයන් සංවර්ධනය කළා.ඒ අල්විස් මැතිතුමාගේ සහභාගීත්වයෙන් ,එතුමාට මා ගෞරවයෙන් ස්තුතිය පුද කර සිටිනවා.

**ගරු ප්‍රාදේශය සභා මන්ත්‍රී කේ.ජී.එස්.ජයතිලක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ටී.සී.නිවාස වල ආසන්නයේ අනතුරුදායක කොස් ගසක් තියෙනවා.එය ඉවත් කර දෙන ලෙස එහි වෙසෙන සනීපාරක්ෂක කම්කරුවන් විසින් ඉල්ලීමක් කර තියෙනවා.
*ජංගම අලෙවිකුටි ටික දෙන කෙනෙකුට දෙන්න සභාපතිතුමා ඒ ටික නිකම්ම දීරලා යන්න දෙන්න එපා.
*.සභාවේ ආයුර්වේද වෙද මහතාගේ සේවය හොඳයි.නමුත් ලෙඩ්ඩු ඉන්නවා උඩ සායනයට යන්න බෑ.එම සායනය පහල මාලයට ගන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ටී.සී.නිවාස අසල කොස් ගහ සම්බන්ධයෙන් විශාල ගැටළුවක් තියෙනවා.අළුත් තීරණයක් අරන් අනතුරුදායක බව ඉවත් කරන්න.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**

අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් ප.ව 2.15 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි.